# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**
**2025 අගෝස්තු / සැප්තැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය
**(නව නිර්දේශය)**

**භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම BUCU – 18214**

ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ඉන්දුනිම්න ශිෂ්ටාචාරය තුළ පැවතියේ යැයි සැලකිය හැකි දේව විශ්වාසයන්හි ස්වරූපය හා විශේෂතා අදාළ මූලාශ්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. වෛදික ආගමික චින්තාවේ විවිධත්වය සැකෙවින් පහදා එය ස්වභාව ධර්මය හා කෙසේ සම්බන්ධ වූයේ දැයි විමර්ශනය කරන්න.

03. උපනිෂද් යුගය තුළ පුද්ගල ජීවිතයේ ආගමික පරමාර්ථය හා අරමුණුවල ඇතිවූ වෙනස්කම් ප්‍රකට කරන්න.

04. ශ්‍රමණ සම්ප්‍රදායයේ ආරම්භය හා විවිධතා සැකෙවින් පහදා එයට අයත් එක් ගුරුකුලයක් පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

05. නියතිවාදය හෝ ශංසයවාදය පිළිබඳ ප්‍රමාණවත් සටහනක් සපයන්න.

06. හොඳ නරක විනිශ්චයෙහි ලා බුදුසමයෙන් ඉදිරිපත් වන නිර්ණායකයන්හි සර්වසාධාරණ ලක්ෂණ පැහැදිලි කරන්න.

07. බෞද්ධ ශීල ශික්ෂාවේ පරමාර්ථය හා අරමුණු ගෙනහැර දක්වන්න.

08. ශ්‍රද්ධාවේ ප්‍රභේද සැකෙවින් විමසා ශ්‍රද්ධාව බෞද්ධ නිවන් මාර්ගයේ පදනම වන ආකාරය පෙන්වා දෙන්න.

09. යථාර්ථාවබෝධයට හා ජීවිතාවබෝධයට ත්‍රිලක්ෂණය පිළිබඳ ඉගැන්වීම් කෙසේ ඉවහල් වන්නේ දැයි සාකච්ඡා කරන්න.

10. පටිච්චසමුප්පාද සිද්ධාන්තයෙහි ලෞකික හා ලෝකෝත්තර අදාළත්වය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

**************************